# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1990/39 - 2016 ඔක්තෝබර් මස 28 වැනි සිකුරාදා - 2016.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : *මහ/ඉ/අත්*/UDA/325.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* ;

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 529 පොල්වත්ත ග්‍රාමනිලධාරි වසම තුළ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක කො 9636 හි පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2941 ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම.

**1. කැබලි අංක 01**

ඉඩමේ නම: ඇටඹගහවත්ත *නොහොත්* කුරුදුගහවත්ත පැරණි පොල්වත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.2857.

2. කැබලි අංක 02

ඉඩමේ නම: ඇටඹගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0084.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 නොවැම්බර් මස 16 වැනි දින පෙ.ව. 9.00 ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 නොවැම්බර් මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ ඒවායේ උධෘත සහ අනෙකුත් ලියවිලි පරීක්ෂණයේ දී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

බුද්ධි තරංගා කරුණාසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

2016 ඔක්තෝබර් මස 25 වැනි දින,
මහරගම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 613